## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

1. ශුද්ධ වූ මරිය තුමිය පිළිබඳව කියැවුන වදන් අතුරෙන් අපගේ ජීවිතවලට වඩාත් අදළ වන්නේ
    (1) "වනිතාවන් අතර අතිශයෙන් වාසනාවන්තිය" යන්න ය.
    (2) "ප්‍රසාද පූර්ණ වන්තිය" යන්න ය.
    (3) "ස්වාමීන් වහන්සේගේ දසිය" යන්න ය.
    (4) "ස්වාමීන් වහන්සේගේ මෑණියන්" යන්න ය.

2. වර්තමාන සමාජ ගැටළු හමුවේ එළිසබෙත්ගෙන් ලැබෙන මහ පෙන්වීම වන්නේ
    (1) හඩක් නැගිය යුතු අවස්ථාවන්හිදි හඩක් නැගීමය.
    (2) දේව කැමැත්ත සිදුවන තෙක් අක්‍රියව බලා සිටීම ය.
    (3) ගැටළු මධ්‍යයේ වුව ද සතුටින් සිටීම ය.
    (4) වැඩිහිටි අදහස් දෙස උපේක්ෂාවෙන් බැලීම ය.

3. ස්නාවක ජොහාන් ද ජේසුස් වහන්සේ ද පෞද්ගලික යාච්ඤාවට හා භාවනාවට වඩාත් සුදුසු ස්ථානයක් ලෙස තෝරා ගත්තේ
    (1) ජෙරුසලම් දේව මාලිගාවයි. (2) පාළුකරයයි.
    (3) සිනගෝගයයි. (4) මුහුදු වෙරළයි.

4. නාසරෙත්හි දේශනයට සවන් දුන් ජනතාව ජේසුස් වහන්සේ හඳුනා ගත්තේ
    (1) ක්‍රිස්තුස් වහන්සේ ලෙස ය. (2) ජෝසෙප්ගේ පුත්‍රයා ලෙස ය.
    (3) දිවැසිවරයෙකු ලෙස ය. (4) දවිත්ගේ පුත්‍රයා ලෙස ය.

5. ජේසුස් වහන්සේගේ මෙහෙය පිළිබඳ නිවැරදි දැක්මක් කරා ශ්‍රාවකයන් යොමු කළ සිද්ධිය වූයේ
    (1) දේව මාළිගාව පිරිසිදු කිරීමයි. (2) කුණාටුවක් සංසිඳු වීමයි.
    (3) රූප විපර්යාසයයි. (4) පන්දහසකට ආහාර සැපයීමයි.

6. "ඉසිලිය නොහැකි බර මිනිසුන් පිට පටවන්නාහුය." ජේසුස් වහන්සේ මෙසේ චෝදනා නැගුවේ
    (1) රෝම රජයට විරුද්ධව ය. (2) විනයධරයන්ට විරුද්ධව ය.
    (3) හෙරෝද් රජුට විරුද්ධව ය. (4) සද්දිසිවරුන්ට විරුද්ධව ය.

7. දෙළොස් හැවිරිදි ජේසු කුමරු දේව මාළිගයේ රැඳී සිටියේ
    (1) තම දෙමාපියන්ගෙන් ඈත් වීමට තීරණය කර තිබූ බැවිනි.
    (2) දේව පියා පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීමට උද්යෝගිමත් වූ බැවිනි.
    (3) නාසරෙත් සිනගෝගයේ දී ලත් අධ්‍යාපනය ප්‍රතික්ෂේප කළ බැවිනි.
    (4) රබ්බි කෙනෙකු වශයෙන් පුහුණු වීමට හැකි වේ යැයි සිතූ බැවිනි.

8. "දෙවියන් වහන්සේ ඉදිරියෙහි මම කවුද?" යන්න වටහා ගැනීමට අපට ඉවහල් වන උපමාව වන්නේ
    (1) යහපත් සමාරිතයාගේ උපමාවයි. (2) පරිසිවරයා සහ අයකැමියා පිළිබඳ උපමාවයි.
    (3) පොහොසත් මෝඩයා පිළිබඳ උපමාවයි. (4) වැන්දඹුව සහ විනිශ්චයකාරයා පිළිබඳ උපමාවයි.

9. ලූක් තුමා වාර්තා කරන ලෙස ජේසුස් වහන්සේ වචනයක්වත් නොපැවසුවේ
    (1) නායක පූජකයන් ඉදිරියේදී ය. (2) සැන්හෙඩ්‍රින් නැමැති ජුදෙව් මන්ත්‍රණ සභාව ඉදිරියේ දී ය.
    (3) පිලාත් ආණ්ඩුකාරයා ඉදිරියේ දී ය. (4) හෙරෝද් රජු ඉදිරියේ දී ය.

10. "තුඹේ දෙවිවන ස්වාමීන් වහන්සේට පමණක් නමස්කාර කරන්න." ඔබ මෙම ජේසු ප්‍රකාශනය විශේෂයෙන් පිළිපැදිය යුත්තේ
    (1) කීර්තිය, වස්තුව, බලය පසු පස යන සමාජ රැල්ලට හසුනොවන පිණිස ය.
    (2) විවිධ විලාසිතාවන්ගෙන් වැළකෙන පිණිස ය.
    (3) වැරදි ආදර්ශ දෙන්නන් ගෙන් මුළා නොවන පිණිස ය.
    (4) නපුරේ බලයට මුළුමනින්ම එරෙහි වන පිණිස ය.

11. විශේෂ දෙළොස් දෙනෙකු ගෝලයන් වශයෙන් තෝරා ගැනීමේදී ජේසුස් වහන්සේ සැලකිලිමත් වූයේ
    (1) ඔවුන්ගේ විශේෂ සුදුසුකම් පිළිබඳව ය. (2) ඔවුන්ගේ ආර්ථික මට්ටම් පිළිබඳව ය.
    (3) ඔවුන්ගේ සමාජමය පසුබිම පිළිබඳව ය. (4) ඔවුන් සම්බන්ධව දේව කැමැත්ත සෙවීම පිළිබඳව ය.

12. දේව රාජ්‍යය වෙනුවෙන් කඳුළු සලන අයට අපේක්ෂා කළ හැකි භාග්‍යය වන්නේ
    (1) සිනාසීමට ඇති හැකියාවයි. (2) පුෂ්ටිමත් ජීවිත ගත කිරීමට ඇති හැකියාවයි.
    (3) කුසගින්න නිවා ගැනීමට ඇති හැකියාවයි. (4) සියලු රෝග වලින් සුවය ලබා ගැනීමට ඇති හැකියාවයි.

13. කාන්තාවන් පිළිබඳව දක්වූ ආකල්ප තුළින් ජේසුස් වහන්සේ කිතුනු කාන්තාවන්ට අභියෝග කරන්නේ
(1) තමන් කාන්තාවන් බව අමතක කරමින් දේව රාජ්‍යයේ සේවයේ නියැලීමට ය.
(2) දේව දරුවන් වශයෙන් සම්පූර්ණ ලෙස දේව රාජ්‍යයේ කටයුතුවල නිරතවීමට ය.
(3) පුරුෂයන් අනුකරණය කරමින් දේව රාජ්‍යයේ සේවයට කැපවීමට ය.
(4) කිතුනු පුරුෂයින්ට මුල් තැන දෙමින් දේව රාජ්‍යයේ සේවය ඉටු කිරීමට ය.

14. ජේසුස් වහන්සේගේ ආහාසය ලත් සාකෙවුස් කරන්නට අදහස් කළ උපරිම පරාර්ථකාමී ක්‍රියාව වන්නේ
(1) තම රැකියාවෙන් ඉවත් වී ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙකු වීමය.
(2) ජේසුස් වහන්සේට ලැගුම් ගැනීම සඳහා තම නිවස සූදානම් කිරීම ය.
(3) අසාධාරණ ලෙස තමා අය කළ මුදල් ආපසු ගෙවීම ය.
(4) තමා සතු සියල්ලෙන් හරි අඩක් දිළිඳුන්ට පරිත්‍යාග කිරීම ය.

15. ජේසුස් වහන්සේ පරිසිවරුන් පිළිබඳව කළ විවේචන මගින් අප ඉගෙනගන්නා ප්‍රධාන පාඩම වන්නේ
(1) යෞඛ්‍ය නීති රීති සියල්ලක්ම පිළිපැදීම අනවශ්‍ය බවයි.
(2) කිතුනු නායකයින් ඔවුන්ගේ අනුගාමිකයන්ට ආදර්ශයක් විය යුතු බවයි.
(3) ආගමික පිළිවෙත් පිළිපැදීමට වඩා ජනතා අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දක්වීම වැදගත් බවයි.
(4) ප්‍රසිද්ධ නමස්කාරයට වඩා පෞද්ගලික යාච්ඤා වැදගත් බවයි.

16. කිතුනු නායකත්වයට ආවේණික ලක්ෂණයක් විය යුත්තේ
(1) සුබසුන් ඉදිරිපත් කිරීම පිළිබඳ නිපුණත්වයයි.
(2) උසස් ආගමික අධ්‍යාපනයක් ලබා තිබීමයි.
(3) සියල්ලන්ට සේවය කිරීමට නැඹුරු වීමයි.
(4) සුබසුන වාචිකව ප්‍රකාශ කිරීමට නොබියව ඉදිරිපත් වීමයි.

17. නැතිවූ පුත්‍රයා පිළිබඳ උපමා කථාව අනුව පව් කළ කෙනෙකුට පියවි සිහිය ලැබූ වහාම ඔහු / ඇය අනිවාර්යයෙන්ම
(1) තමන්ගේ අසරණ කම වටහා ගනියි.
(2) තමන්ගේ නොවටිනාකම වටහා ගනියි.
(3) තමන්ගේ නොදැනුවත්කම වටහා ගනියි.
(4) තමන්ගේ අනුවණකම වටහා ගනියි.

18. "මා අනුව එන්න" යන ජේසු අභියෝගයට නිසි ප්‍රතිචාර දක්වීමට අපට නොහැකි වන්නේ
(1) භෞතික දෑ පිළිබඳ අප දක්වන සැලකිල්ල නිසා ය.
(2) මමත්වය නසා දැමීමට අප තුළ අවංක අධිෂ්ඨානයක් නොමැති නිසා ය.
(3) ස්වාභාවික සම්පත් නිසි ලෙස පරිහරණය කිරීමට අපොහොසත් වන නිසා ය.
(4) අප ආදායමෙන් දහයෙන් කොටසක් දේව සේවය සඳහා පරිත්‍යාග කිරීමට මැළි වන නිසා ය.

19. "කිකිළියක ඇගේ පැටවුන් සිය පියාපත් යටට එක්රැස් කරන්නාක් මෙන්" සිය දයානුකම්පාව දක්වීමට ජේසුස් වහන්සේ කැමතිවූයේ
(1) පවුකාර ස්ත්‍රීන් වෙනුවෙනි.
(2) පවුකාර මිනිසුන් වෙනුවෙනි.
(3) පවුකාර නගරයක් වෙනුවෙනි.
(4) පවුකාර ලොවක් වෙනුවෙනි.

20. කුරුසිපත්වීම ආසන්නව තිබියදී ජේසුස් වහන්සේ විසින් පවසන්නට යෙදුන අනාවැකි අතුරෙන් අපට වඩාත් වැදගත් වන්නේ
A - ජුදස් තමා පාවාදීම පිළිබඳව පැවසූ වදන් ය.
B - දේව මාළිගාව ඇතුළු ජෙරුසලම් නගරය විනාශ වීම පිළිබඳ වදන් ය.
C - ලෝකාන්තය පිළිබඳ බොරු ආරංචි පැතිරවීම පිළිබඳ වදන් ය.
D - කිතුනුවන්ට අනිවාර්යයෙන්ම පීඩා පැමිණීම පිළිබඳ වදන් ය.
මින් වඩාත් වැදගත් වන්නේ
(1) A, B (2) B, C (3) C, D (4) A, D

21. ජේසුස් වහන්සේ ගෙත්සෙමනේදී අධ්‍යාත්මික පොර බැදීමෙන් ජයගත් බවට ප්‍රධාන සාක්ෂිය වන්නේ
(1) තමා පාවා දුන් ජුදස් අනුකම්පා සහගතව පිළිගැනීමයි.
(2) තමා අත්අඩංගුවට ගැනීමට පැමිණි අයට එඩිතරව මුහුණ දීමයි.
(3) තමකම සම්පූර්ණයෙන් නසා දමා දේව කැමැත්තට අවනත වීමයි.
(4) මෙවන් උග්‍ර අවස්ථාවකදී පවා සිය ශ්‍රාවකයින් ගැන සැළකිලිමත් වීමයි.

22. වරදක් කිරීමටත් පෙර සමාව දනය කිරීම පිළිබඳව අභවන ජේසුස් වහන්සේගේ වදන් වූයේ
(1) "ඔබේ ශ්‍රද්ධාව නොබිඳෙන පිණිස ඔබ උදෙසා මම යාච්ඤා කළෙමි" යන්නයි.
(2) "ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයන් ධෛර්යමත් කරන්න" යන්නයි.
(3) "මිත්‍රය, ඔබගේ පව් ඔබට කමා කරන ලදි" යන්නයි.
(4) "ඔබේ ඇදහිල්ල ඔබ සුවපත් කළේය" යන්නයි.

23. කුරුසිපත් ජේසුස් වහන්සේ පිළිබඳව නව ආකල්පයක් ලැබූ බව තම වදනින් හෙළිකළේ
(1) ජේසුස් වහන්සේට විරුද්ධව අත්වැල් බැඳගත් පරිසිවරුන් සහ සද්දුසිවරුන් ය.
(2) ජේසුස් වහන්සේගේ නිදෙස් බව පිළිගත් පිලාත් ආණ්ඩුකාරවරයා සහ හෙරෝද් රජු ය.
(3) ජේසුස් වහන්සේ කුරුසිපත් වීම ඇසින් දුටු සොරෙකු සහ රෝම ශතාධිපතියා ය.
(4) ජේසුස් වහන්සේ පාවා දීමට කුමන්ත්‍රණය කළ ජුදස් සහ නායක පූජකයන් ය.

24. ගෝලයන් දෙදෙනෙකු විසින් මළවුන්ගෙන් උත්ථාන වූ ජේසුස් වහන්සේ හඳුනාගනු ලැබුවේ

(1) උන්වහන්සේ තැන්පත් කළ සොහොන් ගෙය අසලදී ය.
(2) ගෝල පිරිස නවාතැන් ගත් උඩුමහල් කාමරයේදී ය.
(3) මසුන් ඇල්ලීමෙහි යෙදුණු ගෝලයින් නැවත වෙරළට පැමිණි අවස්ථාවේදී ය.
(4) ඔවුන් නවාතැන් ගත් එම්මාවුස් නම් ගමේ නිවසකදී ය.

25. පීඩා වලට මුහුණ පෑමේදී කිතුනුවන් මුල් සභාවේ ආදර්ශය අනුව

(1) පීඩකයන්ට මුහුණ නොදී සැඟව සිටිය යුතු ය.
(2) කිතුනු අනන්‍යතාවය රකිමින් නොබියව පීඩාවන්ට මුහුණ දිය යුතු ය.
(3) පීඩකයන්ට තදබල විවේචන එල්ල කළ යුතු ය.
(4) පීඩා සහිත කාලවල සේවයට විරාමයක් තැබිය යුතු ය.

26. "ඔබ ඔවුන්ට කෑමට යමක් දෙන්නැයි" ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයින්ට පාඨකරයකදී වුවද පැවසුවේ

(1) ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කිරීමට ගෝලයින් සතු හැකියාව විමසීමට ය.
(2) උන්වහන්සේ සිදුකරන්ට යන හාස්කමට ජනතා දයකත්වය අපේක්ෂා කිරීමට ය.
(3) දේව සංරක්ෂණය පිළිබඳව ජනතා විශ්වාසය තහවුරු කිරීමට ය.
(4) ප්‍රධාන වශයෙන් ජනතාවගේ බඩගින්න සංසිඳුවීමට ය.

27. දරුවන් ගැන පැවසූ වදන් අතුරෙන් දරුවෙකු වන ඔබට ජේසුස් වහන්සේ අභියෝගයක් ඉදිරිපත් කරන්නේ

(1) "ඔවුන් නොවළක්වන්නැයි" පැවසීමෙනි.
(2) "දරුවන් මා වෙත එන්ට ඉඩ හරින්නැයි" පැවසීමෙනි.
(3) "දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබඳුවන්නේ යැයි" පැවසීමෙනි.
(4) "මාගේ බැටළුවන් පෝෂණය කරන්නැයි" පැවසීමෙනි.

28. ස්ථිර සාර කිතුනු පවුලක් තුළ තිබිය යුතු විශේෂත්වය වන්නේ

(1) අන්‍යෝන්‍ය ප්‍රේමය සහ වගකීම් බෙදා ගැනීමේ ගුණාංගයයි.
(2) දෙමාපියන් දරුවන් කෙරේ දක්වන දැඩි පාලනයයි.
(3) සියලු දෙනා මුදල් ඉපයීමට දරන වෑයමයි.
(4) දේව වචනය වාචිකව ප්‍රකාශ කිරීමයි.

29. "මම රෝගාතුරව සිටියෙමි. ඔබලා මා බලාගත්තාහු ද?" මෙම ප්‍රශ්නයට කිතුනුවා දෙන සාර්ථකම ප්‍රායෝගික පිළිතුර විය යුත්තේ

(1) "දිනපතා රෝහලට ගොස් රෝගීන්ගේ සුවදුක් විමසමි" යන්නයි.
(2) "මගේ වාහන රථයට යටවූ තැනැත්තා රෝහලට ඇරලීමි" යන්නයි.
(3) "අසරණ රෝගියෙකු ශාරීරිකව හා මානසිකව ශක්තිමත් කළෙමි" යන්නයි.
(4) "රෝහලට ධන පරිත්‍යාගයක් කරන බව පැවසුවෙමි" යන්නයි.

30. ජුදෙව් චාරිත්‍රවලින් අතුරෙන් ශ්‍රී ලාංකික අප බෙහෙවින් අගය කළ යුත්තේ

A - ආගන්තුක සත්කාරයට ඇති කැමැත්තයි.
B - අන්‍ය ජාතීන්ට ගරු කිරීමයි.
C - පොළී නොමැතිව ණය දීමයි.
D - විස්තෘත පවුල් ක්‍රමය පවත්වා ගෙන යාමයි.

මින් වඩාත් නිවැරදි වන්නේ

(1) A, B (2) B, C (3) C, D (4) A, D


31. වර්තමාන බහුවිධ සමාජය තුළ සාමකාමී සහජීවනය අපේක්ෂා කළ හැක්කේ

(1) හැකිතාක් හුදෙකලා ජීවිත ගත කිරීමෙනි.
(2) සමාජයේ ගැටළු යටපත් කිරීමෙනි.
(3) අප අතර තිබෙන පොදු අභිප්‍රායන් තහවුරු කර ගැනීමෙනි.
(4) ආර්ථික සමෘද්ධිය සඳහා එක්සත්ව ක්‍රියා කිරීමෙනි.

32. ජේසුස් වහන්සේගේ ජනප්‍රිය භාවය හීන කිරීමට සද්දුසිවරුන් නැගූ ප්‍රධාන ප්‍රශ්නය වූයේ

(1) "යොහන් බව්තිස්ම ස්නාපනය කිරීමේ බලය ලැබුවේ දෙවියන් වහන්සේ ගෙන් ද නැතහොත් මනුෂ්‍යයන් ගෙන් ද?" යන්නයි.
(2) "ඔබ මේ දේවල් කරන්නේ කුමන අධිකාරී බලයෙන් ද?" යන්නයි.
(3) "සීසර් අධිරාජ්‍යයාට අයබදු ගෙවිය යුතු ද නැද්ද?" යන්නයි.
(4) "එඩින්නට සිටින තැනන්වහන්සේ ඔබ ද?" යන්නයි.

33. දේව රාජ්‍යයේ සලකුණු ලෙස අපට පිළිගත හැකි වර්තමානයේ සිදුවන විශ්මය ජනක සිදුවීම් හෝ අත්දැකීම් වන්නේ
A - සියුම් ශල්‍යකර්ම මගින් දෘශ්‍යාබාධිත අයට පෙනීම ලැබීමයි.
B - අජටාකාශය පිළිබඳව මිනිසා ලබා ඇති දැනුමයි.
C - ගෝලීයකරණය ලොව පුරා පැතිර යාමයි.
D - දකුණු අප්‍රිකාවේ කළු සුදු භේදය අවසන් වීමයි.
මින් වඩාත් නිවැරදි වන්නේ
(1) A, B (2) B, C (3) C, D (4) A, D

34. මෙම රූපය ඔබගේ මතකයට නංවන ජේසුස් වහන්සේ අපට දුන් අභියෝගය වන්නේ

(1) අප සන්තක සියල්ල දේව සේවය සඳහා කැප කිරීමයි.
(2) "සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දීමයි."
(3) දේව සේවය සඳහා පිටත්ව යාමේදී හිස් අතින් යාමයි.
(4) අභිමානයක් ඇති කරගන්නා අදහසින් දන් දීමයි.

35. "අප දසයෝ ය. ස්තුතියක් අපට හිමි නැත. කළ යුතු දේ පමණක් කෙළෙමු" යන්න සිතේ ධාරණය කරගන්නා කිතුනුවා
A - තම සේවය පිළිබඳව තම සිතින් උදම් ඇනීම අපේක්ෂිත ය.
B - නීත්‍යානුකූලව කළ යුතු සියල්ල ඉටු කිරීමට සමත් වීම අපේක්ෂිත ය.
C - තමා කරන සේවය ගැන සෑහීමට පත් නොවීම අපේක්ෂිත ය.
D - තම ක්‍රියා කලාපය නැවත නැවත විවේචනයට ලක් කිරීම අපේක්ෂිත ය.
මින් වඩාත් නිවැරදි වන්නේ
(1) A, B (2) B, C (3) C, D (4) A, D

36. කිතුනුවන්ට දිළිඳුකම බරපතල ප්‍රශ්නයක් වන්නේ
A - ආර්ථික මෙන්ම ආත්මික දිළිඳුකමක් ඇති වුවහොත් පමණි.
B - දේව රාජ්‍යයේ අගයයන් අනුව ජීවත් නොවුනහොත් පමණි.
C - ධනවතුන්ගේ ද ධනය නැතිවී ගියහොත් පමණි.
D - විදේශීය සහනාධාර ලබාදිය නොහැකි වුවහොත් පමණි.
මින් වඩාත් නිවැරදි වන්නේ
(1) A, B (2) B, C (3) C, D (4) A, D

37. දේව මැවිල්ල පිළිබඳ වගකීම මිනිසා පැහැර හරින බව පෙනෙන්නේ
(1) මෙකල ස්වාභාවික ව්‍යසන බෙහෙවින් සිදුවීමෙනි.
(2) පරිසර විනාශයන් සහ මිනිස් ඝාතන බෙහෙවින්ම සිදුවීමෙනි.
(3) නව තාක්ෂණය මගින් චන්ද්‍රිකා යුගයකට එළඹීමෙනි.
(4) ජානමය පර්යේෂණ කෙරේ මිනිසා යොමුවීමෙනි.

38. විවිධ ජන කොටස් අතර ජීවත් වෙන කිතුනුවා මූලික වශයෙන්ම
(1) පරිසරයට ද අන්‍යයන්ට ද සංවේදීව ජීවත් විය යුතු ය.
(2) පාපයේ ඵල විපාක පිළිබඳව සියල්ලන් දැනුවත් කළ යුතු ය.
(3) විවිධ දේශීය සංස්කෘතික අංග විවේචනය කළ යුතු ය.
(4) අන්‍යාගමිකයන් හා සීමිත සබඳතා පැවැත්විය යුතු ය.

39. අර්බුද වලට මුහුණ දෙන්නන් සඳහා පාවුල්ගේ නායකත්වයෙන් කිතුනුවන්ට ලැබෙන මග පෙන්වීම වන්නේ
(1) ඔවුන්ගේ සියලු භෞතික අවශ්‍යතා සැපයීමයි.
(2) ඔවුන්ගේ ආත්ම විශ්වාසය තහවුරු කරමින් ඔවුන් ශක්තිමත් කිරීමයි.
(3) ක්‍රියාකාරී නොවුව ද දෙවි පිහිට පැතීමට ඔවුන් පෙළඹවීමයි.
(4) සහනය ලබා දෙන බවට ඔවුන්ට ස්ථිර පොරොන්දුවක් දීමයි.

40. ජේසුස් වහන්සේ සමඟ පෞද්ගලික සබඳතාවයකට එළඹෙන ඔබ
(1) ඔබේ ජීවිතය පමණක් නොව ලෝකය ද අර්ථවත් කිරීමට ශක්තිය ලබන්නෙහි ය.
(2) ඔබේ ජීවිත අත්දැකීම් අන්‍යයන් සමඟ බෙදාගනු ලබන්නෙහි ය.
(3) අන්‍යයන්ගේ ජීවිත අභ්‍යන්තරය හාරා බැලීමට පෙළඹෙන්නෙහි ය.
(4) සමාජ ප්‍රශ්නයන්ගෙන් ඈත් වීමට තැත් කරන්නෙහි ය.

2.1.3. අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 3 | 21 | 3 |
| 02 | 1 | 22 | 2 |
| 03 | 2 | 23 | 3 |
| 04 | 2 | 24 | 4 |
| 05 | 3 | 25 | 2 |
| 06 | 2 | 26 | 3 |
| 07 | 2 | 27 | 3 |
| 08 | 2 | 28 | 1 |
| 09 | 4 | 29 | 3 |
| 10 | 4 | 30 | 4 |
| 11 | 4 | 31 | 3 |
| 12 | 1 | 32 | 3 |
| 13 | 2 | 33 | 4 |
| 14 | 4 | 34 | 1 |
| 15 | 3 | 35 | 3 |
| 16 | 3 | 36 | 1 |
| 17 | 2 | 37 | 2 |
| 18 | 2 | 38 | 1 |
| 19 | 3 | 39 | 2 |
| 20 | 3 | 40 | 1 |

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 40කි.**

## 2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

★ **I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාරය 1 (පිටුව 8) ඇසුරෙන් සකස් කර ඇත.**

★ 1 වන ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ ප්‍රතිශතයන් සලකා බැලීමේ දී ප්‍රශ්න අංක 3, 11, 12, 13, 21, 25, 28, 29, 36, 39, 40 යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇති ප්‍රමාණය 70%කට වඩා වැඩි පිරිසක් වන අතර, ප්‍රශ්න අංක 2, 17, 19, 32, 33 හා 34 සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 30% ක් හා ඊට අඩු ප්‍රමාණයකි.

★ ප්‍රශ්න අංක 1, 6, 7, 10, 14, 16, 24, 27, 30, 31, 37, 38 සඳහා අයදුම්කරුවන්ගෙන් 50% - 70% අතර ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත. එමෙන්ම 4, 5, 8, 9, 15, 18, 20, 22, 23, 26, 35 ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගෙන් 30% - 50% අතර ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත.

★ අයදුම්කරුවන්ගෙන් වැඩිම ප්‍රතිශතයක් පිළිතුරු ලබා දී ඇත්තේ 25 වන ප්‍රශ්නයට වන අතර එය 94%ක් පමණ වේ. අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කරගෙන පිළිතුරු සපයා ඇති බව දක්නට ලැබෙන අතර, එය එතරම්ම පහසු ප්‍රශ්නයක් වශයෙන් හැඳින්විය නොහැකි වීම විශේෂත්වයකි. තවද අඩුම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු ලබා දී ඇත්තේ 19 වන ප්‍රශ්නයට බව දක්නට ලැබෙන අතර එය 10%ක් පමණ වේ. අපේක්ෂකයින් මෙම ප්‍රශ්නය නිවැරදිව කියවා අවබෝධ කරගෙන නොමැති බැවින්, නිවැරදි පිළිතුර තෝරා ගැනීමට අපහසුවක් දක්වා ඇත. 19 වන ප්‍රශ්නය ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ප්‍රකාශයකට අදාළ පාඨයකි. එය ජෙරුසලම නගරයට අදාළව ප්‍රකාශ කර ඇත. නමුත් පිළිතුරු හතර අතුරින් වඩාත් නිවැරදි පිළිතුර වන "පව්කාර නගරයක් වෙනුවෙනි" යන්න තෝරා ගැනීමට සිසුන්ගෙන් 90%ක් පමණ අපොහොසත් වී ඇත. එබැවින් ප්‍රශ්න අංක 19 යේ රටාවට අයත් ප්‍රශ්න හොඳින් කියවා අවබෝධ කර ගැනීමේ හුරුවක් සිසුන් තුළ නොමැති බැවින් ඒ සඳහා ඔවුන් යොමු කළ යුතු වේ.

★ අපේක්ෂකයින්ගේ ප්‍රතිචාර සැලකීමේ දී පෙළ පොත් හා ශුද්ධ බයිබලයේ, විෂය නිර්දේශයට අදාළ කොටස් මනාව අවබෝධ කර ගැනීමෙන් මතක තබා ගැනීමටත්, සමාජමය හා ආගමික කරුණු කෙරෙහි දැඩි අවබෝධයකින් හා අවධානයකින් පසු විය යුතු බවටත් පැහැදිලි වේ.

★ නිදසුන් වශයෙන් ශු. ලූක්තුමාගේ සුබසුන. ක්‍රියා පොතෙහි අදාළ කොටස්, දේව රාජ්‍යය සම්බන්ධ ඉගැන්වීම්, ජේසුස් වහන්සේ සමකාලීන සමාජය තුළ ක්‍රියා කළ ආකාරය, කිතුනු දිවියට අදාළ ආකල්ප, තත්කාලීන සමාජ ප්‍රශ්න ආදී කරුණු කෙරෙහි වැඩි අවධානයකින් යුතුව, අදාළ කොටස් මැනවින් මතක තබා ගැනීමටත්, නියමිත ග්‍රන්ථ පරිශීලනය කිරීම සඳහා සිසුන් යොමු කිරීමත් වැදගත් වේ.

## 2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

ප්‍රශ්න 7කින් යුක්ත ය. කාලය පැය 02කි.

පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර, කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ කොටස් 10කින් සමන්විත වේ. එක් කොටසකට ලකුණු 02ක් බැගින් මුළු ලකුණු 20කි.

සෙසු ව්‍යූහගත ප්‍රශ්න 6න් 4කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 40කි.

## 2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන

★ II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3 සහ 4 ඇසුරින් සකස් කර ඇත.


### 1 ප්‍රශ්නය

1. (i) ජේසුස් වහන්සේගේ උපත දිළිඳු පරිසරයක සිදුවුනු බවට සාක්ෂි **දෙකක්** ඉදිරිපත් කරන්න.

(ii) ජේසුස් වහන්සේගේ බව්තිස්මය කෙරෙහි දේව බැල්ම ඇතිබව අඟවන සිදුවීම් **දෙක** නම් කරන්න.

(iii) ප්‍රේරිතයන් දෙලොස් දෙනා සඳහා යෙදෙන ග්‍රීක නම කුමක් ද? එහි අර්ථය නම් කරන්න.

(iv) මෙම චිත්‍රයෙහි දක්වෙන සතා පිට නැගී ජේසුස් වහන්සේ ගමන් කළ අවස්ථාව හා එසේ කිරීමෙහිලා උන්වහන්සේගේ අරමුණ සංක්ෂිප්තව දක්වන්න.



(v) බයිබලයේ සඳහන් වන, දෙවියන් වහන්සේ වෙනුවෙන් දුක් විඳීමට මුහුණ දුන් පුද්ගලයන් දෙදෙනෙකු නම් කර ඔවුන් ඒ දුක් කරදර විඳීමට ප්‍රතිචාර දක්වූයේ කෙසේදැයි දක්වන්න.

(vi) පහත සඳහන් කියමන් සම්පූර්ණ කරන්න.

"වෘකයා බැටළුවා සමඟ ..................... "

"සිංහ පැටවාද වසු පැටවාද ..................... "

(vii) පැරණි ගිවිසුමෙහි "ආලේපලත් තැනැත්තන්" ලෙස හඳුන්වනු ලබන්නේ කවරහු ද? අලුත් ගිවිසුම අනුව "මෙසියස්" හෙවත් "ආලේපලත් තැනැත්තා" කවරේ ද?

(viii) "මම ජෙරුසෙලමේදී ස්වාමීන් වන ජේසුස් වහන්සේගේ නාමය නිසා සිරගෙට පමණක් නොව, මැරෙන්නට වුවත් සූදානම්ව සිටිමි." යන්න පැවසුවේ කවු ද? අප එයින් ලබන පණිවුඩය කුමක් ද?

(ix) 'කමාවීමේ ජීවිතය' පිළිබඳව ජේසුස් වහන්සේගේ **එක්** ඉගැන්වීමක් හා උන්වහන්සේ පව්කාරයෙකුට සමාව දුන් අවස්ථාවක් ලුහුඬින් ඉදිරිපත් කරන්න.

(x) "දාවිත් රජ පෙළපත නමැති වෘක්ෂයෙන් රාජාංකුරයක් හට ගන්නේ ය." යන රූපකය ඉශ්‍රායෙල් ජනතාවට ඉදිරිපත් කළේ කවුද? එමගින් ඔහු ඔවුන්ට දුන් පණිවුඩය කුමක් ද? *(ලකුණු 2 × 10 = 20 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(1) (i)
- උන්වහන්සේ බැහැදැකීමට පැමිණියේ දුප්පත් එඬේරු බව
- උන්වහන්සේ ගව ලෙනක උපත ලැබූ බව
- අම්බලමකවත් උන්වහන්සේගේ දෙමාපියන්ට ලැගුම් ගැනීමට නොහැකි වූ බව

(ලකුණු 2)

(ii)
- ස්වර්ගය විවර වී ශුද්ධාත්මයාණෝ පරෙවියෙකු ලෙස උන්වහන්සේ කෙරෙහි පහළ වූ සේක.
  "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය.... ප්‍රසන්නව සිටිමි" අහසින් හඬක් නික්මිණි.

(ලකුණු 2)

(iii)
- "අපොස්තොලෝයි" හෙවත් අපෝස්තුළුවරු එහි අර්ථය - පුහුණු කර යවනු ලැබූවන්

(ලකුණු 2)

(iv) • ජයාන්විතව පෙරහැරින් ජෙරුසලමට අන්තිම වරට ගමන් කළ අවස්ථාව දුප්පතුන්ට සහාය දෙන මේ අහිංසක සතා දේවරාජ්‍යයේ පදනම වන සාමයේ සංකේතය වූ හෙයිනි.

• නිහතමානීත්වය

(ලකුණු 2)

(v)

| තැනැත්තා | දුක | ප්‍රතිචාර |
|---|---|---|
| ආබ්‍රහම් | මව්බිම හා නෑදෑ සනුහරය අත් හැරීම | දෙවියන් වහන්සේ පෙන්නුම් කළ දේශයට ගමන් කිරීම |
| මොසෙස් | ඉශ්‍රායෙල් ජනතාවගේ ප්‍රතික්ෂේපණයට ලක්වීම | ඔවුන් මිසරයේ වහල්කමින් මුදා ගැනීම |
| ජෙරමියා | දිව්‍යැස් වැකි පැවසීම නිසා ජනතාවගේ විරෝධය | නොබියව ඔවුන්ට මඟ පෙන්වීම |
| පාවුල් තුමා | පිලිප්පියේ සිර අඩස්සියකට පත්වීම | ප්‍රශංසා ගීත, යාඥා ආදියෙන් සාක්ෂි දැරීම |

සැ.යු. : මෙයින් දෙදෙනෙකු පිළිබඳ විස්තර සෑහේ.

(ලකුණු 2)

(vi) “වෘකයා බැටළුවා සමඟ වාසය කරන්නේය.”
“සිංහ පැටවා ද වහු පැටවාද එකට කෑම කන්නෝය.”

(ලකුණු 2)

(vii) • පැරණි ගිවිසුමෙහි දිවැසිවරු, පූජකවරු සහ රජවරු ඔවුන්ගේ කාර්යභාරයන් සඳහා කැපවීමේ සංකේතයක් ලෙස ආලේප කරනු ලැබූ නිසා - “ආලේපලත් තැනැත්තන්” ලෙස සලකනු ලැබූහ.

• අළුත් ගිවිසුම අනුව ඉශ්‍රායෙල් ජනතාව බලාපොරොත්තු වූ විශේෂ “ආලේපලත් තැනැත්තා” හෙවත් “මෙසියස්” ජේසුස් වහන්සේම ය.

(ලකුණු 2)

(viii) මේ වචන පැවසුවේ පාවුල් තුමාය.
ජේසුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමේ දී මරණ බිය වත් අපට බාධකයක් නොවිය යුතුයි.

(ලකුණු 2)

(ix) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම අනුව - පශ්චාත්තාප වන අයට සමාව දිය යුතුයි. කමාව අසීමිතව දිය යුතුයි. අප සමාව බලාපොරොත්තුවන සේම සමාව දිය යුතුයි. සතුරන්ට ද සමාව දිය යුතුයි. (මෙයින් එකක් සඳහන් කිරීම සෑහේ.)

• ජේසුස් වහන්සේ සමාව දුන් අවස්ථා - අංශභාග රෝගියෙකු තම මිතුරන් විසින් ජේසුස් වහන්සේ වෙතට ගෙනෙන ලැබූ විට රෝගය සුව කිරීමට පෙර සමාව දානය කිරීම.
• ගල් ගසා මරා දැමීමට නියමිතව තිබුනු ස්ත්‍රියකට විරුද්ධව චෝදනා නැගූ අය අතුරුදහන් වූ විට, ජේසුස් වහන්සේ ඇය පවින් නිදහස් කර, අවවාද සහිතව යන්නට හැරීම.
• පේදුරුගේ අපලාපය සිදුවීමටත් පෙර ඔහුට සමාව අඟවමින් ධෛර්යමත් කිරීම.

(මේවා අතරෙන් එකක් හෝ එවැනි තවත් අවස්ථාවක් සඳහන් කිරීම සෑහේ)

(ලකුණු 2)

(x) යෙසයා දිවැසිවරයා මෙය පැවසුවේ දාවිත්ගේ පෙළපතෙහි පැවැත්මට තර්ජන ඇති වූ සමයකයි. එය සම්පූර්ණයෙන් විනාශ නොවන බව නව ජීවිතය ගෙන දෙන රාජාංකුරයක් පැණ නගින බව පැවසීමෙන් ජනතාව තුළ අනාගතය පිළිබඳ **නව බලාපොරොත්තුවක්** පැන නගින්නට සැලැස්වුයේ ය.

(ලකුණු 2)

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

- ⋆ මෙම ප්‍රශ්නය අනිවාර්ය වුවත් ඒ සඳහා අපේක්ෂකයන්ගෙන් 2.58%ක් පිළිතුරු සපයා නොතිබිණි. (ප්‍රස්තාරය 2 ඇසුරෙනි.)

- ⋆ පළමුවන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 53%ක් පමණ ලකුණු 11 - 20 අතර ලකුණු ප්‍රමාණයක් හිමි කර ගෙන ඇත. 47%ක් පමණ අපේක්ෂකයන් හිමි කර ගෙන ඇත්තේ ලකුණු 0-10 අතර ප්‍රමාණයකි. (ප්‍රස්තාරය 03 ඇසුරෙනි.)

- ⋆ මෙහි (i) කොටසට අපේක්ෂකයන්ගෙන් 66%ක් පමණ සාර්ථකව පිළිතුරු සපයා ඇත. මෙය පහසු ප්‍රශ්නයක් වුවද, අපේක්ෂකයන්ගෙන් 34%කට පමණ සාර්ථක පිළිතුරු සැපයීමට නොහැකි වී ඇත.

- ⋆ මෙම ප්‍රශ්නයේ (ii) කොටසට සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ 75%ක් පමණ පිරිසකි. 25%ක් පමණ වන අපේක්ෂකයන් ප්‍රමාණයකට නිවැරදිව පිළිතුරු ලිවීමට නොහැකි වී ඇත. ප්‍රශ්නය නිසි ලෙස අවබෝධ කර නොගැනීම එයට හේතු වී ඇත.

- ⋆ මෙහි (iii) වන කොටසට සාර්ථකව පිළිතුරු ලිවීමට සමත් වී ඇත්තේ 53%ක් පමණ පිරිසකි. 47%ක් පමණ එයට සාර්ථක පිළිතුරු ලියා නොමැත. මෙහිදී පිළිතුරු කොටස් දෙකකින් සැපයිය යුතු වන අතර, එහි දෙවනුව අසා ඇත්තේ අර්ථය සඳහන් කිරීමට ය. එහි අර්ථය සඳහන් නොකිරීම හෝ පෙළ පොතෙහි සඳහන් වන ග්‍රීක් වචනය දැන නොසිටීම ලකුණු නොලැබීමට හේතු වී ඇත.

- ⋆ මෙම ප්‍රශ්නයේ (iv) වන කොටසට අපේක්ෂකයන්ගෙන් 34%ක් පමණ දෙනා සාර්ථකව පිළිතුරු ලියා ඇති අතර, සෙසු 66%ක් පමණ සාර්ථක පිළිතුරු ලියා නොමැත. ජේසුස් වහන්සේ විසින් සිදුකරන ලද ක්‍රියාවන් හා ඒවායේ අරමුණු පිළිබඳව සිසුන් තුළ ඇති දැනුම අල්ප බව හැඟී යන අතර ඒ සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු වේ.

- ⋆ මෙම ප්‍රශ්නයේ (v) වන කොටසට 97%ක් පමණ අපේක්ෂකයන් සාර්ථක පිළිතුරු සපයා ඇත. වැඩිම සිසුන් පිරිසක් සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ මෙම ප්‍රශ්න කොටස සඳහා වන අතර, ශු. බයිබලයේ එක් කොටසකට සීමා නොකර පොදුවේ පිළිතුර අපේක්ෂා කිරීම නිසා බොහෝ දෙනෙකුට නිවැරදි පිළිතුරු සැපයීම පහසු වී ඇති බව පෙනී යයි.

- ⋆ (vi) වන කොටස සඳහා 66%ක් පමණ අපේක්ෂකයින් සාර්ථකව පිළිතුරු ලියා ඇති අතර මෙයට සාර්ථක ලෙස පිළිතුරු සැපයීමට නොහැකි වී ඇත්තේ 34%ක් පමණ සිසුන් ප්‍රමාණයකට ය. මෙහිදී ශු. බයිබල් පාඨයක් සම්පූර්ණ කිරීම අපේක්ෂිත වූ අතර විශේෂයෙන්ම පෙළ පොතෙහි සඳහන් ශු. බයිබලයේ විෂය නිර්දේශයට අදාළ පාඨ පිළිබඳව අවධානය හා අවබෝධය නොමැති වීම මෙම ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීමට නොහැකි වීමට හේතු වී ඇත. ඒ නිසා වැදගත් පාඨ පිළිබඳව වඩා අවබෝධයෙන් අධ්‍යයනය කිරීමට යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

★ මෙම ප්‍රශ්නයේ (vii) වන කොටස සඳහා 66%ක් පමණ අපේක්ෂකයින් සාර්ථක පිළිතුරු සපයා ඇති අතර, 34%ක් පමණ නිවැරදි පිළිතුර සැපයීමට අපොහොසත් වී ඇත. මෙහිදී පිළිතුර කොටස් දෙකකින් අපේක්ෂා කෙරුනු අතර, ප්‍රථම කොටස සඳහා පිළිතුරු සැපයීමට බොහෝ දෙනෙකු අසමත් වීම විශේෂ ලක්ෂණයකි. මෙවැනි දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා පෙළ පොත නිසි ලෙස අධ්‍යයනය කිරීමට යොමු කිරීම වැදගත් ය.

★ 78%ක් පමණ මෙහි (viii) වන කොටසට පිළිතුරු සපයා ඇත. 22%ක් පමණ වූ පිරිසකගේ පිළිතුර අසාර්ථක වී ඇත. විෂය නිර්දේශයට අදාළ ශු. බයිබල් පාඨ හොඳින් අවබෝධ කර ගැනීම අවශ්‍ය වේ. මෙම පාඨය පෙළපොතේ විශේෂ පාඩමකට අයත් බැවින් එම පාඨ හොඳින් අධ්‍යයනය කොට මතක තබා ගැනීම වැදගත් ය.

★ මෙම ප්‍රශ්නයේ (ix) වන කොටස සඳහා 91%ක් පමණ සාර්ථක පිළිතුරු ලබා දී ඇති අතර සාර්ථක පිළිතුරු සැපයීමට නොහැකි වී ඇත්තේ ස්වල්ප දෙනෙකුට පමණි. මෙම ප්‍රශ්නයට පාදක වන සංකල්පය 10, 11 පෙළ පොත් දෙක මඟින්ම වඩාත් අවධාරණය කිරීම බොහෝ දෙනෙකු සාර්ථක පිළිතුරු ලිවීමට හේතු වී ඇති බව පැහැදිලි ය.

★ මෙහි (x) වන කොටස සඳහා 81%ක් පමණ සාර්ථක පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්නය සඳහා සාර්ථක පිළිතුරු සැපයීමට නොහැකි වී ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 19%කට පමණි. දිවැසිවර ඉගැන්වීම් පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

## 2 ප්‍රශ්නය

2. (i) **දේව රාජ්‍යයේ වර්ධනය නුවා දක්වීම සඳහා ජේසුස් වහන්සේ උපයෝගී කරගත් උපමා කථා දෙකක් සඳහන් කරන්න.**

(ii) **ඉන් එක් උපමා කථාවක් විස්තර සහිතව ඉදිරිපත් කරන්න.**

(iii) **බහු විධ සමාජයක වෙසෙන කිතුනුවා දේව රාජ්‍යයේ ගුණ ධර්ම වගා කිරීමට ක්‍රියා කළ යුත්තේ කෙසේ ද?**

*(ලකුණු 10 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(2) (i) දේව රාජ්‍යයේ වර්ධනය දක්වන උපමා කථා - අබ ඇටය සහ වපුරන්නාගේ උපමාව

(ලකුණු 2)

(ii) අබ ඇටය ඉතා කුඩා වුවත් එය නිසි ලෙස රෝපණය කළොත් ප්‍රමාණවත් ගසක් හට ගනී. අහසේ කුරුල්ලන්ට පවා එහි ලැගුම් ගත හැකිය. මේ අනුව දේව රාජ්‍යය ඉතා කුඩා අන්දමින් හෝ පටන් ගත් විට, එහි වර්ධනය ක්‍රම ක්‍රමයෙන් පුදුමාකාර ලෙස සිදු කෙරේ. ජුදෙව් ජනතාව පමණක් නොව "අහසේ කුරුල්ලන්" ලෙස හඳුන්වන ලද අන්‍ය ජාතින් ද දේව රාජ්‍යයට ඇතුළත්වීම අපේක්ෂිත ය.

හෝ

වපුරන්නා විසින් තම කෙතෙහි වපුරන ලද බීජ වලින් සමහරෙක් මඟ දිගේ වැටී, කුරුල්ලන්ට හිමි විය. ගල් බිමෙහි වැටුනු බීජ පැලවූ කෙතෙහිම දිය සීරාව නොමැතිව වියළී ගියේය. කටු අතර වැටුනු බීජ කටු ගස් මඟින් යටපත් කරනු ලැබීය. එහෙත් සරු බිමෙහි පැළ වූ බීජ සිය ගුණයක් අස්වැන්න බිහි කරයි. මෙම උපමාව අවධාරණය යොමු කරන්නේ සරු බිමෙහි වැටුණු බීජ කෙරෙහි ය. නොයෙක් හේතූන් නිසා ඇතැම් බීජ නාස්ති වුනත්, දේව රාජ්‍යයේ වර්ධනය පුදුමාකාර අන්දමින් සිදුවන බවයි.

(ලකුණු 3)

(iii) බහු විධ සමාජයක දේව රාජ්‍යයේ ගුණ ධර්ම වගා කිරීම සාමකාමී වාතාවරණයක සිදු කළ යුතුය. සියළු වෙනස්කම් නොතකා මිත්‍ර ලීලාවෙන් සියළු දෙනා පිළිගැනීම අපේක්ෂිත ය. සුහද අදහස් හුවමාරුවට තුඩු දෙන අවස්ථා වලින් නිසි ප්‍රයෝජන ගත යුතුයි. එමෙන්ම අපට වඩා වෙනස් අදහස්, ගති පැවතුම් ඇති අයට ගරු කරමින් ඔවුන් තේරුම් ගැනීමට යුහුසුළු විය යුතුයි. අප සමාජයේ සියළු දෙනාගේම පොදු බව තහවුරු කරන ව්‍යායාමවලට අත හිත දිය යුතුයි. දේව රාජ්‍යයේ ගුණ ධර්ම තම ජීවිතය තුළ හුවා දැක්වීම වඩාත් වැදගත් ය. **(ලකුණු 5)**

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

| |
|---|
| අපේක්ෂකයන්ගෙන් 89%ක් පමණ මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් 49%කට ආසන්න පිරිසක් ලබා ගෙන ඇත්තේ ප්‍රශ්නයට නියමිත ලකුණු 10න් 5ක් හෝ ඊට අඩුවෙනි. ලකුණු 5කට වැඩියෙන් ලබා ගත් පිරිස 51%ක් පමණ වේ. මෙම ප්‍රශ්නයේ (i) කොටසට 69%ක් පමණ සාර්ථකව පිළිතුරු සපයා ඇති අතර එහි (ii) වන කොටසට 65%ක් පමණ සාර්ථක ලෙස පිළිතුරු දී ඇත. එහි (iii) කොටසට සාර්ථක පිළිතුරු ලියා ඇත්තේ 60%ක පමණ පිරිසකි. ජේසුස් වහන්සේගේ දේව රාජ්‍යය සම්බන්ධ ඉගැන්වීම් හා එම ඉගැන්වීම් ප්‍රායෝගිකව තම සමාජය තුළ ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව වඩා ගැඹුරින් හැදෑරිය යුතුය. |

## 3 ප්‍රශ්නය

**3. (i) එඬේර සංකල්පය ඉශ්‍රායෙල් ජනතාව අතර වර්ධනය වීමට තුඩුදුන් සාධක කවරේ ද?**

**(ii) ඉශ්‍රායලීය නායකයන් මෙම සංකල්පයෙන් බැහැර වීමෙන් දක්නට ලැබුන අයහපත් ප්‍රතිඵල එසකියෙල් දිවැස්වරයා ඉදිරිපත් කරන්නේ කෙසේ ද?**

**(iii) ජේසුස් වහන්සේ තුළ දිස්වූ එඬේර ගුණාංග චරිතායනය කරමින් කිතුනු නායකයන් තම මෙහෙය ඉටුකළ යුත්තේ කුමන ආකාරයෙන්දැයි පැහැදිලි කරන්න.** ***(ලකුණු 10 යි)***

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(3) (i) ඉශ්‍රායෙල් ජනතාවගේ මූලාරම්භය පටන් එඬේර වෘත්තිය පූර්ණ ආදායම් මාර්ගයක් හා ජීවන ශෛලීයක් වූ හෙයින් එඬේරා සහ බැටළුවා අතර පැවතුනේ ඉතා සමීප සම්බන්ධතාවයකි. එහෙයින් දෙවියන් වහන්සේ මාගේ එඬේරාය යන සංකල්පය ඔවුන් අතර බිහිවීම ඉතා ස්වාභාවිකය. එමෙන්ම දෙවියන් වහන්සේ නියෝජනය කළ රජවරු, පූජකවරු, සහ දිවැසිවරු එඬේරු වශයෙන් පිළිගැනින. **(ලකුණු 2)**

(ii) මෙම සංකල්පයෙන් බැහැර වීමේ ප්‍රතිඵල - "එඬේරු" (නායකයන්) තමන්ගේම පෝෂණය මුදුන් පමුණුවා ගැනීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් විසින් ජනතාව කෲර ලෙස පාලනය කරන ලදී. ජන නායකයන් සෙනඟගෙන් ප්‍රයෝජන ලැබීමට තැත් කළ හෙයින් ජනතාව පීඩනයට පත් වූහ. ජනතාවගේ දුක් කරදර කම් කටොලුවලට විසඳුම් ලැබුනේ නැත. නොමග ගිය අය මුදා ගැනීම සිදු නොවීය. විසිර ගිය බැටළුවන් වන මෘගයන්ට (අයහපත් අනුහස්වලට) ගොදුරු වූහ.

(මේවා අතරෙන් කරුණු 3ක් ඉදිරිපත් කිරීම සෑහේ)

**(ලකුණු 3)**

(iii) "යහපත් එඬේරා" වන ජේසුස් වහන්සේ චරිතායනය කරමින් කිතුනු නායකයන් විසින් කිතු සමාජයෙන් බැහැරව ගිය අය ගැන විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුයි. ඔවුන්ට සමාව දානය කරමින් ඔවුන්ට නැවත කිතුනු රැලට එක්වීමට අනුකම්පා සහගතව මග පාදා දිය යුතුය.

ජනතාව නිසි ලෙස කිතුනු දේව වචනයෙන් පෝෂණය කිරීමට වග බලාගත යුතුයි. එඬේරා ගති පැවතුම් පාමින් ජනතාවගේ සියළුම අවශ්‍යතා ගැන සැලකිලිමත් විය යුතුයි. ඔවුන් අතර දුප්පත්කම තුරන් කිරීමට ගත හැකි පියවර (ව්‍යාපෘති) දියත් කළ යුතුය. දුක් විඳින, ලෙඩින් සිටින, පීඩා විඳින අය මෙන්ම දුර්වල අය - මහළු අය සහ දරුවන් - ගැන විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය. **(ලකුණු 5)**

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

2 වන ප්‍රශ්න පත්‍රයට අදාළ ප්‍රශ්න අතුරෙන් අපේක්ෂකයන්ගෙන් 33%කට ආසන්න අවම සිසුන් පිරිසක් පිළිතුරු සපයා ඇති ප්‍රශ්නය වේ. මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන්ගෙන් (i) වන කොටසට සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ 20%ක් පමණ පිරිසකි. එමෙන්ම (ii) වන කොටසට 13%ක් පමණ සාර්ථකව පිළිතුරු සපයා ඇත. එහි (iii) වන කොටසට සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ 24%ක් පමණ පිරිසකි.

මෙම ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 10 න්, පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් 63%ක් පමණ ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් වන අතර, ලකුණු 5කට වැඩියෙන් ලබා ගෙන ඇත්තේ 37%ක් පමණ පිරිසකි.

විශේෂයෙන්ම මෙහි (ii) වන කොටසින් පැරණි ගිවිසුම් සංකල්ප පිළිබඳ අවබෝධය පරීක්ෂා කෙරෙන අතර, ඒ පිළිබඳ දැනුවත් වීම අවම මට්ටමක පවතින බව පෙනේ.

ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුම හා නව ගිවිසුම සම්බන්ධ කෙරෙන සංකල්ප හා ඉගැන්වීම් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් එම දැනුම යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වේ.

## 4 ප්‍රශ්නය

**4. දුක සහ වේදනාව සමාජයේ වෙසෙන කා හට කුමන අවස්ථාවක දී හෝ විවිධ අන්දමින් මුහුණ පෑමට සිදුවන බව කවුරුත් පිළිගන්නා කරුණකි.**

**(i) දුක ඇතිවීමට හේතු දෙකක් ලුහුඬින් සටහන් කර ඉන් ඇතිවන අහිතකර ප්‍රතිඵල ලියා දක්වන්න.**

**(ii) දුක් විඳීම පිළිබඳව බයිබලයේ පැරණි ගිවිසුමෙහි ඉස්මතු කෙරෙන ආකල්ප කවරේ ද? ඔබේ පිළිතුර උදාහරණ සහිතව ඉදිරිපත් කරන්න.**

**(iii) ජේසුස් වහන්සේ සහ මුල් කිතුනු සභාව ආදර්ශයට ගනිමින්, කිතුනුවන් දුක් විඳීම මධ්‍යයේ ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න.** *(ලකුණු 10 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(4) (i)

| දුක් ඇතිවීමට හේතුව | අහිතකර ප්‍රතිඵල |
|---|---|
| රැකියා හිඟය | නිසි ආදායමක් නොමැතිව දුප්පත් වීම, බඩගින්න, මන්ද පෝෂණය |
| සූදුවට ඇබ්බැහි වීම | ආදායම් අපතේ යෑම, දරුවන් දුක් කරදර රැසකට ගොදුරු වීම |
| ලෙඩ රෝග වැළඳීම | රැකියා අහිමිවීම |
| නපුරු බලවේගවලට අසුවීම | පාපයෙන් පිරුණු ජීවිත ගත කිරීම, පවුල් බිඳ වැටීම |

(මෙවැනි දුක් විඳීමට හේතු 2ක් හා ප්‍රතිඵල 3ක් ලුහුඬින් ඉදිරිපත් කිරීම සෑහේ)

**(ලකුණු 2)**

(ii) දුක් විඳීම පිළිබඳ පැරණි ගිවිසුමෙහි දැක්වෙන ආකල්ප

- යම් පුද්ගලයෙකු හෝ ජනතාවක් දේව කැමැත්තට පිටුපාමින් ක්‍රියා කළේ ද, එහි විපාක අනිවාර්යයෙන් විඳින්නට සිදුවේ. උදා: සාවුල් රජතුමා සාමුවෙල්ට අකීකරු වීම නිසා යුද්ධයෙන් පරාජය වී මැරුම් කෑවේය.
- ආදම් සහ ඒව දේව නියෝගවලට අකීකරු වීමෙන් ඒදන් උයනේ සුවදායක ජීවිතය ඔවුන්ට අහිමි විය. ඉශ්‍රායෙල් ජනතාවට විදේශික රටවල විප්‍රවාසීව වාසය කරන්නට සිදු වූයේද මේ නිසාය.
- ජෝබ් වැනි යහපත් අය දුක් විඳීම අභිරහසකි. ජෝබ් දුක් වින්දේ තමාගේ පාපය නිසා නොවේ. යෙසායා ජෙරමියා වැනි දිවැසිවරු දෙවියන් වහන්සේ වෙනුවෙන් දුක් විඳීම ඔවුන්ගේ කාර්යයභාරයේ අනිවාර්ය කොටසක් බව පිළිගැනින.

**(ලකුණු 3)**

(iii) නව ගිවිසුමෙහි දැක්වෙන ජේසුස් වහන්සේ හා මුල් කිතුනු සභාවේ ආකල්ප අනුව දේව රාජ්‍ය වෙනුවෙන් දුක් විඳීම භාග්‍යයක් ලෙස පිළිගත යුතුයි. පීඩාවට ලක් වූ මුල් සභාව මෙන් කිතුනු ස්ථාවරයෙහි රැඳී සිටීමට ශක්තිය අයැද සිටිය යුතුය. පිළිප්පියේ සිරගෙදරක සිටි පාවුල් මෙන් දුක් කරදර මැද සාක්ෂි දැරීමට ඉදිරිපත් විය යුතුය. අන්‍යයන්ගේ දුක් කරදර තමා පිටට ගනිමින් ඒවා සැහැල්ලු කිරීමට උත්සාහ දැරිය යුතුය. සමාජයේ අසාධාරණකම් අවසන් කිරීම සඳහා එම අධිෂ්ඨානය දරන අය සමඟ අත්වැල් බැඳගෙන බාධක නොතකා ක්‍රියා කළ යුතුය. එදිනෙදා ගත කරන ජීවිත තුළ කිතුනු ආකල්ප අනුව ජීවත් වීමෙන් ඇතිවන විරෝධය නොතකා එම ආකල්ප නොපිරිහෙලා ඉස්මතු කළ යුතුය.

**(ලකුණු 5)**

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

අපේක්ෂකයන්ගෙන් 79%ක් පමණ මෙම ප්‍රශ්නය තෝරාගෙන පිළිතුරු සපයා ඇත. එයින් (i) වන කොටසට 87%ක් පමණ ද, (ii) වන කොටසට 76%ක් පමණ ද, (iii) වන කොටසට 77%ක් පමණ ද වශයෙන් සාර්ථක පිළිතුරු ලිවීමට ප්‍රයත්න දරා තිබුණ ද, මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10න්, පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් 60%ක් පමණ හිමිකරගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි. ලකුණු 5කට වැඩියෙන් ලබාගත් කොටස 40%ක් පමණ ය. සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නයේ සියලු කොටස්වලට පිළිතුරු සැපයීමට ප්‍රයත්න දැරීම සතුටුදායක මට්ටමක පවතී.

මෙම ප්‍රශ්නය සාමාජීය කරුණු ආශ්‍රිතව පිළිතුරු ලිවිය යුතු ප්‍රශ්නයකි. මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පහසු කරවීම සඳහා පෙළ පොත් හා ශුද්ධ බයිබලීය දැනුමට අමතරව විවිධ ව්‍යාපෘති, කණ්ඩායම් ක්‍රියා වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් වෙත යොමු කරවීම වැදගත් වේ.

## 5 ප්‍රශ්නය

5. "අන්‍ය ජාතීන්ගේ අපෝස්තුළුවරයා" වශයෙන් පාවුල් තෝරා ගැනීමට ඔහුගේ උපතේ පටන් දෙවියන් වහන්සේ අදහස් කළ බව පාවුල්ට දැනින.

(i) **පාවුල්ගේ ජීවිත පසුබිම අළලා මෙය සනාථ කිරීමට කරුණු හතරක් ඉදිරිපත් කරන්න.**

(ii) **පාවුල්ගේ තරුණවියේ ජීවිත පසුබිම ඔහුගේ ධර්මදූත සේවයට රුකුලක් වූ අන්දම ඔහුගේ ධර්මදූත චාරිකා වලට ඇතුළත් අත්දැකීම් උදාහරණ ලෙස යොදගෙන පැහැදිලි කරන්න.**

(iii) **කිතුනු ධර්මදූත සේවකයන්ට සහ නායකයන්ට පාවුල්තුමාගේ මේ අත්දැකීම් වලින් ලබාගත හැකි මගපෙන්වීම කුමක් ද?** *(ලකුණු 10 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(5) (i)
- පාවුල් "අන්‍යජාතීන්ගේ අපෝස්තුළුවරයා වීමට ඉවහල් වූ සාධක - පලස්තීනයෙන් බැහැරව සිරිසියාවේ තාර්සස් හි උපත ලැබීමෙන් කුඩා කළ සිටම <u>අන්‍ය ජාතීන් ආශ්‍රය කිරීමට අවකාශ ලැබීම.</u>
- අන්‍යජාතීන්ගේ කෘති පිළිවෙත්, සිරිත් විරිත්, ඇදහිලි විශ්වාස ආදිය ගැන ප්‍රමාණවත් දැනුමක් ලබා ගැනීම.
- තාර්සස්හි පැවතුන ප්‍රසිද්ධ විශ්ව විද්‍යාලයේ ආභාෂය ද ඔහුට අනිවාර්යයෙන් ලැබෙන්නට ඇත.
- රෝම පුරවැසිභාවය උරුමයෙන් ලැබූ වරප්‍රසාදයක් ලෙස ඔහුට හිමි වීම.
(එහෙයින් ඔහුගේ සෙබ්‍රෙව් නම සාවුල් වුව ද, පාවුල් නමැති ග්‍රීක් නමට ද හිමිකම් දැක්වීම.) (සැ.යු. - සාධක 4ක් ලිවීම සෑහේ)

**(ලකුණු 2)**

(ii) **පාවුල්ගේ තරුණ වියේ ජීවිත පසුබිම ඔහුගේ ධර්මදූත සේවයට රුකුලක් වූ අන්දම**

- එරිසි පවුලකට අයත් පාවුල්ට ගමාලියෙල්ගේ පාමුල ජුදෙව් ආගම ගැන මුහුකුරා දැනුමක් ලැබුන නිසා ජුදෙව්වරුන්ගේ තර්කවලට නිසි පිළිතුරු සැපයීමට හැකිවිය.
- කුඩා කළ සිටම කූඩාරම් සෑදීමේ හස්ත කර්මාන්තයේ පුහුණුවක් ලැබූ නිසා එම කර්මාන්තයේ යෙදුන අකිලා සහ ප්‍රිසිලා වැනි අය සමග නවාතැන් ගැනීමට හා තමා ද තමා සමග ගමන් කළ අයද පෝෂණය කිරීමට හැකිවීම.
- පිලිප්පිය වැනි ස්ථානවල නඩුකාරයන් හමුවේ තම රෝම පුරවැසිභාවයට සම්බන්ධ අයිතිවාසිකම් යොදා ගෙන ඔවුන්ගේ අසාධාරණකමට එරෙහිව කටයුතු කිරීමට හැකිවීම.
- ලූස්ත්‍රාවේදී සොබා දහම තුළ දෙවියන් වහන්සේ ක්‍රියා කරන අන්දම එම අන්‍යජාතීන්ට පිළිගැන්වීමට හැකිවීම.
- ඇතන්ස් හි වැසියන්ට දේශනා කිරීමේ දී ඔවුන්ගේම කවිවරුන්ගේ කියමන් උපයෝගි කර ගෙන ඔවුන් මෙතෙක් නාඳුනන දෙවියන් වහන්සේ ගැන දේශනා කිරීමට හැකිවීම.
(මේවායින් 3ක් ඉදිරිපත් කිරීම සෑහේ)

**(ලකුණු 3)**

(iii)
- කිතු දහම ගැන තම දැනුම වර්ධනය කර ගැනීම.
- දේව රාජ්‍යයේ සේවය වෙනුවෙන් තම හැකියාවන් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම.
- අන්‍යයන්-විශේෂයෙන් අන්‍ය ආගමිකයන් ගැන සැලකිලිමත් වෙමින් ඔවුන්ගේ ඇදහිලි ආකල්ප ආදිය ගැන ප්‍රමාණවත් දැනුමක් ලබා ගෙන එය ධර්මදූත සේවය සඳහා යොදා ගැනීම.
- කිතුණු සභාවෙන් පෝෂණය වීම වෙනුවට එම සභාව පෝෂණය කිරීමට තැත් කිරීම.
- අසාධාරණය දුටු තැන ඊට විරුද්ධව පියවර ගැනීමට ඉදිරිපත් වීම.

**(ලකුණු 5)**

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය අපේක්ෂකයන්ගෙන් 45%ක් පමණ තෝරාගෙන ඇත. එයින් (i) වන කොටස සඳහා 77%ක් පමණ ද, (ii) වන කොටස සඳහා 77%ක් පමණ ද, (iii) වන කොටස සඳහා 85%ක් පමණ ද, සාර්ථක පිළිතුරු සපයා ඇත. ප්‍රශ්නයට හිමි ලකුණු 10න්, 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 48%ක් පමණ වේ. සෙසු අපේක්ෂකයන් වන 52%ක් පමණ වූ වැඩි පිරිස ලකුණු 5ට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් වී ඇත. මෙය සාමාන්‍යයෙන් ජනප්‍රිය මාතෘකාවක් යටතේ එන ප්‍රශ්නයක් වුවද, එයටම අදාළ වෙනත් ප්‍රශ්නයක් ප්‍රශ්න පත්‍රයේ පැවතීම හේතුවෙන් සිසුන් මෙම ප්‍රශ්නය තෝරා ගැනීම අඩු වීමක් දක්නට ලැබේ. මෙම ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන් ප්‍රශ්න කොටස් තුන සඳහා ම සාපේක්ෂව සතුටුදායක මට්ටමින් පිළිතුරු සපයා තිබීම විශේෂ ලක්ෂණයකි. තමා සතුව පවතින උපරිම අවබෝධයට හා විෂය දැනුමට අදාළව වඩාත් වැඩි ලකුණු ප්‍රමාණයක් අත්කර ගත හැකි ප්‍රශ්න තෝරා ගැනීමට අපේක්ෂකයන් යොමු කිරීම වැදගත් වේ.

## 6 ප්‍රශ්නය

6. (i) **පාවුල්තුමා තුළ ජීවිත පරිවර්තනයක් ඇතිවූ බවට සාක්ෂි පළමුවෙන් හෙළිවූයේ කුමන සිද්ධිය ආශ්‍රිතව ද?**
   (ii) **'හැරීම' යන්නෙන් කිතුනුවන් අදහස් කරන්නේ කුමක් ද?**
   (iii) **ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ ඇතිකරන ජීවිත පරිවර්තනය තහවුරු කරණු වස් ඔබගේ පැරණි ජීවන රටාව ඉවතලීමට ඔබ ගන්නා පියවර කවරේ ද?** *(ලකුණු 10 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(6) (i) පාවුල්තුමා දමස්කයට යන ගමනේ දී ඔහුට ජේසුස් වහන්සේ මුණ ගැසීමේ සිද්ධිය ඔහු අවට බැබලුන ආලෝකය හා ඔහු අමතා ජේසුස් වහන්සේ පැවසූ වදන්වලට ඔහුගේ ප්‍රතිචාරය, ස්වාමිනි ඔබ කවුද? යන්නෙන් ඇඟ වෙන්නේ ඔහු එම මොහොතේ සිට තමාගේ සම්පූර්ණ විශ්වාසය ජේසුස් වහන්සේ කෙරෙහි තබමින්, තම ජීවිතය සම්පූර්ණයෙන් පරිවර්තනය කිරීමට අධිෂ්ඨානය කළ බවයි.

**(ලකුණු 2)**

(ii) "හැරීම" යන්නෙන් කිතුණුවන් අදහස් කරන්නේ හුදෙක් හැඟීම් බර මොහොතකට සීමා වූ ක්ෂණික තීරණ ගැනීමක් නොවේ. එය මුළු ජීවිතයටම දේව රාජ්‍යයේ අනුහසට යටත්ව නිරන්තර පරිවර්තනයකට හසු කිරීමකි. යමෙක් "හැරුණු" බවට සාක්ෂි ඔහු/ ඇය තම ජීවන ශෛලියෙන් දැක්විය යුතුය. කිතුණු ආගමට "හැරණු" තැනැත්තෙක් අන් සියළු දෙනාම සහෝදර ප්‍රේමයෙන් පිළිගෙන ඔවුන් ආශ්‍රය කිරීමට බැඳී සිටියි.

**(ලකුණු 3)**

(iii) අන්‍ය ආගමිකයන් ඇතුලු අපට වඩා වෙනස් පුද්ගලයන් දෙස "වපර ඇසින්" බැලීම නතර කළ යුතුයි.

- ⋆ තමාගේ ජීවන ශෛලීය තියුණු විවේචනයට ලක් කරමින් ජේසුස් වහන්සේ මෙන් ඉතා චාම් ජීවන ශෛලියක් අනුගමනය කළ යුතුයි.
- ⋆ තමා වෙනුවෙන් නොව අන්‍යයන් වෙනුවෙන් ජීවත්වීමට තුඩු දෙන අන්දමට තමාගේ ගෙදර පරිසරය පාසලේ/ වැඩ කරන ස්ථානයේ පරිසරය කෙරෙහි අනුහසක් දැක්විය යුතුය.
- ⋆ "තමන්ගේ පාඩුවේ" ජීවත් වීම වෙනුවට තමා තුළ ද, සමාජය තුළ ද නපුරට විරුද්ධව ක්‍රියා කිරීමෙන් එයින් ඇති වන විපාකවලට නිර්භීතව මුහුණ දිය යුතුයි.

★ "ජේසුස් වහන්සේගේ ප්‍රේමය අපටම විශේෂයයි නොසිතා සියළු දෙනාටම එම ප්‍රේමය අප තුළින් ගලා යන්නට සැලැස්වීම." (ලකුණු 5)

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

අපේක්ෂකයන් සංඛ්‍යාවෙන් 81%ක් පමණ මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත. එයින් (i) වන කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 75%ක් පමණ ද, (ii) වන කොටස සඳහා 81%ක් පමණ ද, (iii) වන කොටස සඳහා 77%ක් පමණ ද, සාර්ථක පිළිතුරු සපයා ඇත.

අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය සැලකීමේ දී පැහැදිලි වනුයේ මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10න් පිළිතුරු ලියූ අපේක්ෂකයන්ගෙන් 47%ක් පමණ ලකුණු 5 හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇති බවයි. ලකුණු 5ට වැඩියෙන් ලබාගත් ප්‍රමාණය 53%ක් පමණ වේ.

අයදුම්කරුවන්ගෙන් වැඩි පිරිසක් මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අතර, පිළිතුරු සැපයීම ද සාර්ථක බව පෙනී යයි. ඒ අතුරින් බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයේ කොටස් තුනටම සාර්ථකව පිළිතුරු සැපයීම කැපී පෙනෙන ලක්ෂණයකි. මෙය සාමාන්‍යයෙන් සිසුන් බොහෝ දෙනෙකු අපේක්ෂා කරන හා අනුමාන කරන මාතෘකාවක් යටතේ සැකසෙන ප්‍රශ්නයක් වීමත් මාතෘකාව ඉතා හුරු පුරුදු වීමත්, ප්‍රශ්නය සරල වීමත් ප්‍රතිඵල සතුටුදායක වීමට බලපා ඇත.

## 7 ප්‍රශ්නය

**7. (i) ප්‍රේමයේ ජීවිතයට පදනම වශයෙන් ජේසුස් වහන්සේ ස්ථාපනය කළ පනත් දෙක සටහන් කරන්න.**

**(ii) පාවුල් තුමා විසින් කොරින්ති වාසීන්ට යවන ලද පළමුවන ලිපියේ ඉදිරිපත් කර ඇති ප්‍රේම පාරමිතාවට ඇතුළත්, කිතුනුවන් තමන් තුළ ප්‍රගුණ කළ යුතු ගුණාංග කවරේ ද?**

**(iii) ඔබ තුළ ජේසුස් වහන්සේගේ ප්‍රේමය ක්‍රියාකාරීව පවතින්නේ නම් එය විදහා පෑමට ගෙදරදී, පාසලේදී හා සමාජයේදී ඔබ ක්‍රියා කළ යුතු අන්දම විස්තර කරන්න.** *(ලකුණු 10 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(7) (i) ප්‍රේමයේ ජීවිතයට පදනම් වන ආඥා දෙක

★ නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු ආත්මයෙන් ද, නුඹේ මුළු වීර්යයෙන් ද නුඹේ මුළු බුද්ධියෙන් ද, නුඹේ දෙවි වූ ස්වාමීන් වහන්සේටත් නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියන්ටත් ප්‍රේම කරන්න. (ලකුණු 2)

(ii) මේ සඳහා කිතුණුවන් ප්‍රගුණ කළ යුතු ගුණාංග

★ නිරතුරුවම <u>ඉවසිලිවන්ත</u> වීම - සෑම විටම කරුණාව දැක්වීම

★ <u>විනීත ගති</u> පැවතුම් වර්ධනය කිරීම - අනුන්ගේ වැරදි ගැන නොව හරිදේ ගැන ප්‍රීති වීම.

(ඊර්ෂ්‍යාව, උඩඟුකම, ආත්මාර්ථකාමය පිටු දැකීම)

දෙවියන් වහන්සේ කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබීම.

(නිරතුරුවම කිතුණු බලාපොරොත්තුවෙහි රැඳී සිටීම)

(මේවා අතුරෙන් 3ක් ලිවීම අපේක්ෂිතයි)

(ලකුණු 3)

(iii) ඔබ තුළ ජේසුස් වහන්සේගේ ප්‍රේමය හුවා දැක්වීම සඳහා

- ★ ගෞරවයෙන් තමාට වඩා අනෙක් අය උතුම් කොට සැලකිය යුතුය.
- ★ නිවසේ දී ඕනෑම සේවයක් ඉටු කර දීමට නැඹුරුවක් දැක්විය යුතුය.
- ★ නිවසට පැමිණෙන අයගේ තරා තිරම් නොතකා ඔවුන්ට එක හා සමානව උපස්ථාන කිරීම.
- ★ පාසැලේ දී සිසු/ සිසුවියන් අතර භේද හට ගැනුනු අවස්ථාවලදී, සාමකාමීව ගැටළු විසඳා ගැනීමට මඟ පෙන්වීම ලබා දීම.
- ★ සමාජයේ දූෂිත සිරිත් විරිත්වලින් බැහැර වීම පමණක් නොව, තමා ආශ්‍රය කරන අය ඒවායින් බේරා ගැනීමට ක්‍රියා කිරීම.

(සැ.යු. - මෙවන් වෙනත් අදහස්වලට ලකුණු දීම අපේක්ෂිත ය.)

**(ලකුණු 5)**

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

අපේක්ෂකයන්ගෙන් 57%ක් පමණ මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත. මෙම ප්‍රශ්නයේ (i) වන කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 38%ක් පමණ ද, (ii) වන කොටස සඳහා 83%ක් පමණ ද, (iii) වන කොටස සඳහා 75%ක් පමණ ද, සාර්ථක පිළිතුරු සපයා ඇත.

ලකුණු ලබා ගෙන ඇති ආකාරය විශ්ලේෂණය කිරීමේ දී මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10න් 5ක් හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 48%ක් පමණ ප්‍රතිශතයකි. අපේක්ෂකයන්ගෙන් 52%ක් පමණ වූ පිරිස ලබා ගෙන ඇත්තේ ලකුණු 5කට අඩුවෙනි.

මෙම ප්‍රශ්නයේ (i) වන කොටස සඳහා ශුද්ධ බයිබලයෙන් නියමිත පාඨ ලිවීමේ දී සමහර සිසුන් සාර්ථක වුවද බොහොමයක් සිසුනට ප්‍රශ්නය අවබෝධ කරගත නොහැකි වී තිබිණි. මෙහි ජේසුස් වහන්සේ විසින් නියම කරන ලද පණත් දෙකක් ලිවීමට තිබුණ ද, සිසුන් ලියා ඇත්තේ දසපණතට අදාළ පණත් බැවින් ලකුණු අවම වීමට එය බලපා තිබිණි. නමුත් (ii) හා (iii) වන කොටස් මගින් සමකාලීන සමාජයේ අත්දැකීම් හා අවබෝධය විමසා තිබූ බැවින්, ප්‍රායෝගික අදහස් ඉදිරිපත් කිරීම හේතු කොටගෙන වැඩි ලකුණු ප්‍රමාණයක් හිමි කර ගැනීමට සිසුන් සමත් ව තිබිණි. මෙහිදී අදාළ බයිබල් පදනම ගැන නිසි දැනුමක් තිබීම වැදගත් වන අතර, සමාජය සම්බන්ධ වන ආකාරය විමසන මෙම වර්ගයේ ප්‍රශ්න ගැන වැඩි අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

## III කොටස

# 3.0 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස් :**

- ★ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද? කුමන ප්‍රශ්න අනිවාර්යය ද? කොපමණ කාලයක් ලැබේ ද? කොපමණ ලකුණු ලැබේ ද? යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.

- ★ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් තෝරා ගත යුතුය. තවද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය.

- ★ II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

- ★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

- ★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

- ★ ප්‍රශ්න අංක හා අනු කොටස් නිවැරදිව ලිවිය යුතුය.

- ★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.

- ★ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.

**විශේෂ උපදෙස්**

- ★ පිළිතුරු සැපයීමේ දී භාවිතා කළයුතු ශුද්ධ වූ බයිබල් සංස්කරණ පිළිබඳව සැලකිලිමත් වීම.
  නිදසුන් :- 1996 තේමා පටුන සහිත සංස්කරණය

- ★ පිළිතුරු සැපයීමේ දී, විශේෂයෙන් අසා ඇති අවස්ථාවලදී හැර ශු. ලූක් සුභාරංචියට සීමා වීම.

3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

- විෂය නිර්දේශය, ශු. බයිබලය, පෙළපොත්, ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය, බාහිර සම්පත් මූලාශ්‍ර පිළිබඳ ව ගුරුභවතුන් මෙන්ම සිසුන් ද දැනුවත්වීම තුළින් ඒවායේ භාවිතය අවශ්‍ය ය.
- විෂයයට නියමිත ශු. ලූක් සුබසුන හා අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතේ අදාළ කොටස් මනාව අධ්‍යයනය කිරීම සඳහා සිසුන් යොමු කළ යුතු වේ.
- ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්, ක්‍රියාකාරකම්, සැලසුම්, තක්සේරුව හා ඇගයීම යන කොටස් කෙරෙහි ගුරුභවතුන්ගේ දැඩි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.
- ගුරුවරයා සිසුන්ගේ සාධන මට්ටම් අනුව අවස්ථානුකූලව නිර්මාණශීලි විය යුතු ය.
- ඉගැන්වීමේ දී ගවේෂණය තුළින් ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබාදිය යුතු ය.
- නිරන්තරයෙන් ශු. බයිබලය පරිශීලනය කිරීමට සැලැස්වීම තුළින් පිළිතුරු සැපයීමට මනා පුහුණුවක් ලබා දීම වැදගත් ය.
- කාලීන සමාජ තොරතුරු ගවේෂණයෙන් දැනුම යාවත්කාලීන කිරීම සඳහා සිසුන් යොමු කළ හැකි ඉගෙනුම් අවස්ථා සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ.
- විෂය ඉගැන්වීමේ දී ගුරු භූමිකාව හා ක්‍රියාකාරිත්වය තුළින් සිසුන්ගේ විශ්වාසය හා ඇදහිල්ල වර්ධනය වීමට මං පැදිය යුතු ය.
- ගුරුවරයා විෂය කරුණුවල ප්‍රවීණයකු විය යුතු අතර, නවීන ක්‍රම ශිල්ප භාවිත කරමින් දරුවන්ගේ මනසේ රුදෙන ආකාරයට විෂය දැනුමෙන් දරුවා පෝෂණය කළ යුතු ය.